# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2310/37 - 2022 දෙසැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 1/2012(v)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) (ඹඋ), (ඹඋඉ) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ඩග්ලස් දේවානන්දා,
ධීවර අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2015 මාර්තු මස 26 වැනි දින අංක 1907/47 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මහ මුහුදේ ධීවර මෙහෙයුම්වල යෙදෙන ධීවර බෝට්ටු චන්ද්‍රිකා දත්ත මගින් අධීක්ෂණය කිරීමේ පද්ධතිය (VMS) ක්‍රියාත්මක කිරීමේ නියෝග 2015, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 1 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"1. මේ නියෝග ශ්‍රී ලංකා ජල තීරයේ සහ මහ මුහුදේ ධීවර මෙහෙයුම්වල යෙදෙන ධීවර යාත්‍රා සඳහා, චන්ද්‍රිකා දත්ත (VMS) මගින් අධීක්ෂණය කිරීමේ පද්ධතිය සහ වෙනත් ඉලෙක්ට්‍රොනික යාත්‍රා අධීක්ෂණය කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.";

(2) එහි ආදේශ කරන ලද 1 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"I කොටස

"චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ යාත්‍රා අධීක්ෂණය කිරීමේ පද්ධතිය (VMS)";

(3) එහි 2 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"2. යම් තැනැත්තෙකු විසින්, (මෙහි මින්මතු දෙපාර්තමේන්තුව යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (මෙහි මින්මතු "ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගොඩබිම ඇති ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය මගින් එම යාත්‍රාව සොයා ගැනීමට හා හඳුනා ගැනීමට ඉඩ සලසන පරිදි, දෙපාර්තමේන්තුව මගින් අනුමත කරනු ලැබූ (මෙහි මින්මතු " VMS උපකරණය" යනුවෙන් සඳහන් කරනු ලබන) චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ යාත්‍රා අධීක්ෂණ පද්ධති උපකරණය එම යාත්‍රාවට සවිකර ඇත්නම් මිස, යම් බහුදින ධීවර යාත්‍රාවක් ධීවර කටයුතුවල සහ ධීවර ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සහ ධීවර මෙහෙයුම් වල යෙදීම සඳහා යොදා ගනු නොලැබිය යුතු ය." ;

(4) ආදේශ කරන ලද 2 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය මෙහි 2අ නියෝගය ලෙස බලාත්මක විය යුතු යː-

"2අ. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, යම් බහුදින ධීවර යාත්‍රාවක් සඳහා සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන VMS උපකරණයක් එහි ඇත්නම් මිස, ඒ සඳහා යම් යාත්‍රා ලියාපදිංචියක්, ලියාපදිංචිය අලුත් කිරීමක්, යාත්‍රාව පැවරීමක් හෝ එකී බහුදින ධීවර යාත්‍රාව පිටත්වීම සඳහා වන අනුමතියක් නිකුත් කරනු නොලැබිය යුතු ය. " ;

(5) 2අ නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"ප්‍රධානියාගේ, නියමුවාගේ, ලියාපදිංචි හිමිකරුගේ හෝ බලපත්‍රලාභියාගේ වගකීම්

3. යම් බහුදින ධීවර යාත්‍රාවක ලියාපදිංචි හිමිකරු විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද VMS උපකරණයක් එම යාත්‍රාවේ ස්ථාපනය කරනු ලැබිය යුතු අතර, VMS උපකරණය නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ වෙනත් සේවාවන් වැනි සේවාවන් ලබා ගැනීම මේ නියෝග වල III වන කොටසේ සඳහන් ලියාපදිංචි සේවා සපයන්නන්ගෙන් පමණක් ලබා ගනු ලැබිය යුතු ය.";

(6) (අ) එහි 3 වන නියෝගය 3අ නියෝගය ලෙස නැවත අංකනය කිරීමෙන්;
(ආ) නැවත අංකනය කරන ලද 3අ නියෝගයේ "නියමුවා, හිමිකරු හෝ බලපත්‍රලාභියා යන වචන වෙනුවට "නියමුවා, ලියාපදිංචි හිමිකරු හෝ බලපත්‍රලාභියා" යන වචන ආදේශ කිරීමෙන්;

(7) නැවත අංකනය කරන ලද 3අ නියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් නියෝග ඇතුළත් කිරීමෙන් :-

"3ආ. යම් ධීවර යාත්‍රාවක ප්‍රධානියා, නියමුවා, ලියාපදිංචි හිමිකරු හෝ බලපත්‍රලාභියා විසින්, එම යාත්‍රාවේ ඇති VMS උපකරණය, 3අ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු හෝ දත්ත එය හරහා පහසුවෙන් ලබා ගත හැකි වන ආකාරයකින් පවත්වාගෙන යනු ලබන බවට වගබලා ගනු ලැබිය යුතු ය.

3ඇ. යම් ධීවර යාත්‍රාවක ලියාපදිංචි හිමිකරු හෝ බලපත්‍රලාභියා විසින්, එම යාත්‍රාව සඳහා අවශ්‍ය සේවාවන් සහ අලුත්වැඩියා කිරීම් ලබා ගැනීම පිණිස මේ නියෝගවල III වන කොටස යටතේ ලියාපදිංචි වී ඇති අදාළ නඩත්තු සැපයුම්කරුවකු සමග සම්බන්ධව කටයුතු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

3ඈ. යම් ධීවර යාත්‍රාවක ලියාපදිංචි හිමිකරු හෝ බලපත්‍රලාභියා විසින්, ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානයට එම යාත්‍රාව අධීක්ෂණය කිරීමට ඉඩ ලබා දීම සඳහා අඛණ්ඩ චන්ද්‍රිකා සේවාවක් ලබා ගැනීම පිණිම නිසි කලට අදාළ චන්ද්‍රිකා දත්ත ගාස්තු ගෙවනු ලැබිය යුතු ය.

3ඉ. යම් ධීවර යාත්‍රාවක ප්‍රධානියා, නියමුවා, ලියාපදිංචි හිමිකරු හෝ බලපත්‍රලාභියා විසින්, එම ධීවර යාත්‍රාවේ ඇති VMS උපකරණය සැමවිටකදීම සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන VMS උපකරණයක් වන බවට වග බලා ගනු ලැබිය යුතු අතර, කිසිදු තැනැත්තෙකු විසින්, එම ධීවර යාත්‍රාවේ ස්ථාපනය කර ඇති VMS උපකරණය විනාශ කිරීම, ඊට හානි සිදු කිරීම, එය ක්‍රියා විරහිත තත්ත්වයකට පත් කිරීම හෝ අන්‍යාකාරයකින් ඊට මැදිහත් වීම සිදු කරනු නොලැබිය යුතු ය. තව ද, උපකරණයට අදාළව පහත දැක්වෙන ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන් ම තහනම් විය යුතු ය. :-

(අ) කවර හෝ ආකාරයකින් යාත්‍රා අධීක්ෂණ පද්ධති (VMS) දත්ත වෙනස් කිරීම ;

(ආ) VMS උපකරණයට සම්බන්ධ කර ඇති ඇන්ටනාව හෝ ඇන්ටනාවලට භෞතිකව බාධා කිරීම ;

(ඇ) VMS උපකරණයට ලැබෙන විද්‍යුත් සැපයුම භෞතික ක්‍රමවේද මගින් නවතාලීම ; සහ

(ඈ) දෙපාර්තමේන්තුවේ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානයේ පූර්ව අනුමැතිය නොමැතිව VMS උපකරණය ධීවර යාත්‍රාවත් ඉවත් කිරීම හෝ එය යාත්‍රාවේ ස්ථාපනය කර ඇති ස්ථානය වෙනස් කිරීම.

3ඊ. ධීවර යාත්‍රාවක නියමුවා හෝ ප්‍රධානියා විසින්, VMS උපකරණය සහ එහි ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය මගින්, එම ධීවර යාත්‍රාව -

(අ) ජල තීරයට සහ සමුද්‍රීය සම්පත්වලට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් විශේෂ රීති අදාළ වන යම් සමුද්‍රීය ප්‍රදේශයකට;

(ආ) කලාපීය ධීවර සමුද්‍රීය සංවිධානය මගින් නියාමනය වන ප්‍රදේශ වලට ;

(ඇ) වෙනත් යම් රාජ්‍යයකට අධිකරණ බල ප්‍රදේශයට අයත් ජල තීරයකට ; සහ

(ඈ) දෙපාර්තමේන්තුව මගින් නම් කරනු ලැබිය හැකි, සීමා කරන ලද හෝ අන්‍යාකාරයකින් වන වෙනත් යම් ප්‍රදේශයකට,

ඇතුළු වන හෝ ඉන් පිටවන දිනය හා වේලාව අධීක්ෂණය කිරීමට වගබලා ගැනීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

3උ. යම් සමුද්‍ර සංරක්ෂණ ප්‍රදේශයක හෝ සීමා කරනු ලැබූ ප්‍රදේශවලට සිට නාවික සැතපුම් විස්සක් දක්වා ආසන්න ප්‍රදේශයේ ක්‍රියාත්මක වන යම් ධීවර යාත්‍රාවක් හෝ එම ආසන්න ප්‍රදේශයේ රැඳී සිටින යම් අන්තර් හුවමාරු ප්‍රදේශයේ තිබෙන යාත්‍රාවක් පැයෙන් පැයට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සුදුසු යයි තීරණය කරනු ලබන වෙනත් යම් කාල විවේක තුළ අධීක්ෂණය කරනු ලැබිය යුතු ය." ;

(8) ඉහතින් වූ 3උ නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන ශීර්ෂය ඇතුළත් කිරීමෙන් :-

"ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානයේ වගකීම්" ;

(9) එහි 4 වන නියෝගයේ (2) වන අනු නියෝගය ඉවත් කිරීමෙන් ;

(10) එහි 8 වන නියෝගයේ (i) වන ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(i) යාත්‍රා අධීක්ෂණය මෘදුකාංගය සහ චන්ද්‍රිකා සේවාව නිසි පරිදි ක්‍රියාත්මක වන බවට වගබලා ගනු ලැබිය යුතු ය ;"

(11) එහි 8 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"8අ. ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය විසින් -

(අ) අවදානම් ධීවර යාත්‍රා සමීප ලෙස අධීක්ෂණය කිරීමට ඉඩ ලබාදීම සඳහා පද්ධතිය තුළ එම යාත්‍රා සලකුණු කර හඳුනා ගනු ලැබිය යුතු ය;

(ආ) මසුන් අල්ලා ගැනීමේ ස්ථානවල දත්ත තහවුරු කර ගැනීමේ, සෝදිසි කිරීමේ සහ ගලවා ගැනීමේ මෙහෙයුම්, යම් නීති විරෝධී, වාර්තා නොවන සහ අවිධිමත් ධීවර කටයුතු (IUU) හඳුනා ගැනීම සහ ධීවර දෙපාර්තමේන්තුව තුල සිදු කරන වෙනත් විමර්ශනවල කාර්යය සඳහා යාත්‍රා සොයා ගැනීමේ දත්ත සපයනු ලැබිය යුතු ය;

(ඇ) ධීවර දෙපාර්තමේන්තුව විසින් නිල වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන මධ්‍යගත දත්ත පදනම සහ තොරතුරු කලමනාකරණ පද්ධතිය වෙත VMS දත්ත පදනම තුළින් සෘජුවම ප්‍රවේශය ලබා දීම තහවුරු කරනු ලැබිය යුතු ය ;

(ඈ) යම් ධීවර යාත්‍රාවකින් ලබා ගත් දත්ත අවම වශයෙන් වසර පහක කාලසීමාවක් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් දක්වා මෘදු පිටපත් හෝ දෘඩ පිටපත් වශයෙන් වාර්තා කර සංරක්ෂණය කිරීමට වගබලා ගනු ලැබිය යුතු ය ;"

(12) එහි 9 වන නියෝගයේ "හිමිකරු" සහ "SSB ගුවන් විදුලි සන්නිවේදන ක්‍රම ආදී සන්නිවේදන පහසුකම් මගින්"යන වචන වෙනුවට පිළිවෙලින්, "ලියාපදිංචි හිමිකරු" සහ "SSB ගුවන් විදුලි සන්නිවේදන ක්‍රම වැනි යම් සන්නිවේදන පහසුකමක් මගින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් ඉලෙක්ට්‍රොනික ක්‍රමයක් මගින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(13) එහි 10 වන නියෝගයේ "දෙපාර්තමේන්තුවේ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය මගින් සෑහීමකට පත්වන අයුරින්" යන වචන වෙනුවට "ඊට සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන VMS උපකරණයක් ලෙස ක්‍රියා කිරීමට ඉඩ ලබා දෙමින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(14) එහි 11 වන නියෝගයේ "යාත්‍රා අධීක්ෂණ පද්ධති උපකරණය" සහ "දෙපාර්තමේන්තුවේ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය මගින් ලිඛිතව බලය පවරනු ලබන තෙක්" යන වචන වෙනුවට, පිළිවෙලින්, "VMS උපකරණ" සහ "අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගෙන ඇත්නම් මිස" යන වචන ආදේශ කිරීමෙන් ;

(15) එහී8 12 වන නියෝගය ඉවත් කිරීමෙන් ;

(16) එහි 13 වන නියෝගයේ "ප්‍රධානියා හෝ හිමිකරු," යන වචන වෙනුවට "ප්‍රධානියා හේ ලියාපදිංචි හිමිකරු," යන වචන ආදේශ කිරීමෙන් ;

(17) එහි 14 වන සහ 15 වන නියෝග ඉවත් කිරීමෙන් ;

(18) එහි 19 වන නියෝගය ඉවත් කිරීමෙන් ;

(19) එහි 20 වන නියෝගය ඉවත් කිරීමෙන් ;

(20) ඉවත් කරන ලද 20 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

## II කොටස

### "ස්වයංක්‍රීය හඳුනා ගැනීමේ පද්ධති සහ වෙනත් ඉලෙක්ට්‍රොනික අධීක්ෂණ පද්ධති"

20. යම් ධීවර යාත්‍රාවක අනිවාර්යයෙන් තිබිය යුතු VMS උපකරණයට අමතරව මෙහෙයුම් කාර්ය සඳහා (මෙහි මින්මතු "AIS" යනුවෙන් ද සඳහන් කරනු ලබන) යම් ස්වයංක්‍රීය හඳුනා ගැනීමේ පද්ධතියක් හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික අධීක්ෂණ පද්ධතියක් භාවිතා කිරීමට අපේක්ෂා කරනු ලබන යම් ධීවර යාත්‍රාවක ලියාපදිංචි හිමිකරුවකු විසින් මේ නියෝගවල III වන කොටස යටතේ ලියාපදිංචි වී ඇති බලයලත් සැපයුම්කරුවන්ගෙන් සහ සේවා සපයන්නන්ගෙන් එම උපකරණ ලබා ගනු ලැබිය යුතු ය.

21. ධීවර යාත්‍රාවේ ලියාපදිංචි හිමිකරු විසින්, ස්වයංක්‍රීය හඳුනා ගැනීමේ පද්ධතිය (AIS) යාත්‍රාවේ ස්ථාපනය කර ඇති විටදී එහි අනන්‍ය අනුක්‍රමික අංකය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ලැබිය යුතු ය.

22. ධීවර යාත්‍රා සඳහා වන ස්වයංක්‍රීය හඳුනා ගැනීමේ පද්ධතියේ සහ ධීවර ආම්පන්න සලකුණු කිරීමේ බෝයවන් සඳහා වන ස්වංක්‍රීය හඳුනා ගැනීමේ පද්ධතියේ අනන්‍ය අනුක්‍රමික අංකය පිළිවෙලින් පහත දැක්වෙන ආකෘති වලින් විය යුතු යඃ-

(i) [417] (යාත්‍රාවේ ලියාපදිංචි අංකයේ ඉලක්කම්) (දිස්ත්‍රික් දුරකථන කේතයේ අවසාන ඉලක්කම් දෙක)

(ii) [99 [417] (ඉලක්කම් හතරේ අනුක්‍රමික අංකය) ;

23. යම් තැනැත්තෙකු විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ඇතිව මිස ධීවර යාත්‍රාවකට අදාළව භාවිතා කරන ස්වයංක්‍රීය හඳුනා ගැනීමේ පද්ධති උපකරණ, වෙනත් ඉලෙක්ට්‍රොනික අධීක්ෂණ පද්ධති හෝ ධීවර ආම්පන්න සලකුණු කිරීමේ බෝයාවන් සඳහා වන ස්වයංක්‍රීය හඳුනා ගැනීමේ පද්ධති වෙනත් ධීවර යාත්‍රාවකට මාරු කරනු නොලැබිය යුතු ය.

24. යම් ධීවර යාත්‍රාවක ප්‍රධානියා, නියමුවා, ලියාපදිංචි හිමිකරු හෝ බලපත්‍රලාභියා විසින්, ස්වයංක්‍රීය හඳුනා ගැනීමේ පද්ධති බෝයාවන් යම් සීමා කරන ලද ප්‍රදේශයකට හෝ වෙනත් යම් රාජ්‍යයක අනන්‍ය ආර්ථික කලාපයකට (EEZ) ගසාගෙන යාම හෝ ධීවර ආම්පන්න සලකුණු කිරීමේ ස්වයංක්‍රීය හඳුනා ගැනීමේ පද්ධති අස්ථානගත වීම හෝ නැතිවීම පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු අතර යාත්‍රාවේ ලියාපදිංචි හිමිකරු විසින්, ධීවර යාත්‍රාවේ ලියාපදිංචිය ඉවත්කිරීම, ධීවර යාත්‍රාව පැවරීම හෝ විකිණීම සිදු වූ අවස්ථාවක පැය හැත්තෑ දෙකක් (පැය 72) ඇතුළත එය විසන්ධි කර ස්වයංක්‍රීය හඳුනා ගැනීමේ පද්ධති කේතය මකා දැමීම හෝ ස්වයංක්‍රීය හඳුනාගැනීමේ පද්ධති උපකරණය යාත්‍රාවෙන් ඉවත් කිරීම කරනු ලැබිය යුතු ය.

25. ධීවර යාත්‍රාවේ ලියාපදිංචි හිමිකරු විසින්, ධීවර යාත්‍රාවේ ලියාපදිංචිය ඉවත් කිරීම, ධීවර යාත්‍රාව පැවරීම හෝ විකිණීම සිදු වූ අවස්ථාවක, 24 වන නියෝගය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා නොකළ වෙනත් ඉලෙක්ට්‍රොනික අධීක්ෂණ උපකරණ සහ අදාළ මෘදුකාංග ධීවර යාත්‍රාවෙන් විසන්ධි කරනු ලැබිය යුතු ය.

## III කොටස

## සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම

26. මේ නියෝගවල I වන කොටසේ සහ II වන කොටසේ සඳහන් චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ යාත්‍රා සොයා ගැනීමේ උපකරණ සහ වෙනත් ඉලෙක්ට්‍රොනික අධීක්ෂණ උපකරණ සැපයීමට සහ එම උපකරණවලට අදාළ නඩත්තු සේවා සැපයීමට අපේක්ෂා කරනු ලබන යම් තැනැත්තෙකු විසින් එම අදාළ කාර්ය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු ය.

27. 26 වන නියෝගය යටතේ ලියාපදිංචි වීමට අපේක්ෂා කරනු ලබන යම් තැනැත්තෙකු විසින් මේ නියෝගවල III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුව වූ ඉල්ලුම්පත්‍රයක් රුපියල් දස දහසක (රු. 10,000.00) ලියාපදිංචි ගාස්තුවක් ද සමග අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

28. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එම නිෂ්පාදන පිළිබඳ තාක්ෂණික ඇගයීමක් සිදු කිරීමෙන් පසු, මේ නියෝගවල IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුව යාත්‍රා සොයා ගැනීමේ උපකරණ සැපයීම ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

29. 28 වන නියෝගයේ සඳහන් ලියාපදිංචි සහතිකය, තත්කාර්යය සඳහා 27 වන නියෝගයේ සඳහන් ලියාපදිංචි ගාස්තුව සමග ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රයකට අනුව ලියාපදිංචිය අලුත් කිරීමට යටත්ව, එය නිකුත් කළ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

30. 28 වන නියෝගය යටතේ ලියාපදිංචි කරන ලද යම් යාත්‍රා සොයා ගැනීමේ උපකරණයක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන මෘදුකාංග සහ වෙනත් සේවාවන් හා අනුකූල විය යුතු අතර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත, පරිපාලන පරිශීලක බලය සහිත මෘදුකාංග අතුරු මුහුණත මාර්ගයෙන් උපකරණය අදාළ පද්ධතියට සක්‍රීය කිරීම් අධීක්ෂණය කිරීම සඳහා, ප්‍රවේශය ලබා දෙනු ලැබිය යුතු ය.

31. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 28 වන නියෝගය යටතේ ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබූ ලියාපදිංචි සැපයුම්කරුවන් සහ ඔවුන් විසින් සපයනු ලබන උපකරණය සහ සේවාවන් පිළිබඳ විස්තර ද සමග ඒ පිළිබඳ යාවත්කාලීන කරන ලද ලැයිස්තුවක් ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

IV කොටස

**සේවා සපයන්නන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීම**

**(චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ අධීක්ෂණ පද්ධති (VMS)/ස්වයංක්‍රීය හඳුනාගැනීමේ පද්ධති (AIS)/ වෙනත් ඉලෙක්ට්‍රොනික අධීක්ෂණ උපකරණ)**

32. සේවා සපයන්නා විසින් -

(1) මේ නියෝගවල III වන කොටසේ සඳහන් යම් විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට ;

(2) මේ නියෝග යටතේ වන වරදකට වරදකරු වී ඇති බවට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත් වන්නා වූ අවස්ථාවක දී, මේ නියෝගවල 28 වන නියෝගය යටතේ ඔහු විසින් ප්‍රදානය කරන ලද ලියාපදිංචියක් අවලංගු කරනු ලැබිය යුතු ය."

21. මේ නියෝගවල "යාත්‍රාව" යන වචනය දක්වෙන කවර හෝ අවස්ථාවක ඒ වෙනුවට "ධීවර යාත්‍රාව" යන වචන ආදේශ කිරීමෙන් ;

22. (අ) එහි 21 වන නියෝගය 33 වන නියෝගය ලෙස නැවත අංකනය කිරීමෙන් ;

(අ) නැවත අංකනය කරන ලද 33 වන නියෝගයේ,

(i) "ධීවර කටයුතු ආශ්‍රිත ක්‍රියාකාරකම්" යන අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"ධීවර යාත්‍රාව" යන්නෙන්, ධීවර කටයුතු හෝ ධීවර කටයුතු ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරනු ලබන, භාවිත කිරීමට සූදානම් කරනු ලැබූ හෝ භාවිත කිරීමට අපේක්ෂා කරනු ලබන යම් යාත්‍රාවක්, නැවක් හෝ බෝට්ටුවක් අදහස් වේ ;

(ii) "ධීවර යාත්‍රාව" යන අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන යාත්‍රා අධීක්ෂණ පද්ධති (VMS) උපකරණය" යන්නෙන්, අඛණ්ඩ විදුලි සැපයුමක් සහ චන්ද්‍රිකා සම්බන්ධතාවක් සහිතව කිසිදු තාක්ෂණික දෝෂයකින් තොරව ක්‍රියාත්මක වන්නා වූ ද යාත්‍රා අධීක්ෂණ පද්ධති මෘදුකාංග අතුරු මුහුණතෙහි දිස් වන්නා වූ ද යාත්‍රා අධීක්ෂණ පද්ධති ට්‍රාන්ස්පොන්ඩරය සහ එහි ඇති සියලුම උපාංග අදහස් වේ ;

(iii) "නීති විරෝධී, වාර්තා නොවන හා අවිධිමත් ධීවර කටයුතු" යන අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"වෙනත් ඉලෙක්ට්‍රොනික අධීක්ෂණ උපකරණය" යන්නෙන්, තුන්වන පාර්ශ්වයක් විසින් එම උපකරණය අධීක්ෂණය කිරීමට ඉඩ ලබා දීම සඳහා එම උපකරණයේ අනන්‍යතාවය සම්බන්ධයෙන් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් තොරතුරු විමෝචනය කළ හැකි උපකරණ හෝ ඒ ආශ්‍රිත මෘදුකාංග අදහස් වේ. ;

(iv) "වරාය" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"අවදානම් යාත්‍රාව" යන්නෙන්, එකී යාත්‍රාව භාවිත කර සිදු කරන ලද උල්ලංඝනය කිරීම්වල ඉතිහාසය මත පදනම්ව හඳුනා ගනු ලබන 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ සාදනු ලබන රීති සහ නියෝග උල්ලංඝනය කිරීමේ හැකියාවක් පවතින යාත්‍රාවක් අදහස් වේ. ;

(v) ඒ නියෝගයේ "යාත්‍රාව" යන අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්;

23. එහි II වන උපලේඛනයට ඉක්බිතිවම පහත දක්වෙන අලුත් උපලේඛන ඇතුලත් කිරීමෙන් :-

27 වන නියෝගය

III වන උපලේඛනය

**ශ්‍රී ලංකා ජල තීරයේ සහ මහ මුහුදේ ක්‍රියාත්මක වන ධීවර බෝට්ටු සඳහා චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ යාත්‍රා අධීක්ෂණ පද්ධතිය (VMS) සහ වෙනත් ඉලෙක්ට්‍රොනික අධීක්ෂණ ප්‍රොටෝකෝල සැපයීම සඳහා ලියාපදිංචි වීම සඳහා වන ඉල්ලුම් පත්‍රය**

අ. යාත්‍රා සැපයුම්කරු පිළිබඳ විස්තරය :-

1. දේශීය සමාගමේ නම :
2. ලිපිනය :
3. සමාගම් ලියාපදිංචි අංක :
4. VAT ලියාපදිංචි අංකය :
5. ප්‍රධාන සම්බන්ධතාවයේ නම සහ තනතුරු :
6. ප්‍රධාන සම්බන්ධතාවයේ දුරකථන අංකය :
7. ප්‍රධාන සම්බන්ධතාවයේ විද්‍යුත් තැපැල් ලිපිනය :

ආ. උපකරණ සහ ඒ ආශ්‍රිත සේවාවන් පිළිබඳ මූලික පිරිවිතර :-

1. උපකරණයේ නම (වර්ගය සහ මාදිලිය):
2. මූලාරම්භ රට :
3. නිෂ්පාදිත රට :
4. නිෂ්පාදිත වර්ෂය :
5. මෘදුකාංග අතුරු මුහුණත පිළිබඳ විස්තර :

ඇ. සේවා තොරතුරු :-

1. වගකීම් :
2. අලෙවියෙන් පසු සේවා :
3. ශ්‍රී ලංකාව තුල වැඩපොල තිබේද යන්න :
4. අමතර කොටස් ලබා ගැනීමේ හැකියාව :
5. මත්ස්‍ය තොග පවතින ප්‍රමාණය :

ඈ. ඉලක්කගත ධීවර කණ්ඩායම පිළිබඳ විස්තර :-
(උදා- බෝට්ටු හිමිකරු, නියමුවන් ආදිය)

ඉ. පිරිවැය පිළිබඳ පියවර :-

1. උපකරණයේ පිරිවැය (ආනයනය, අනුමැතිය, ප්‍රවාහන ආදිය ඇතුළුව)
2. ස්ථාපන පිරිවැය
3. මෘදුකාංග සහ සත්කාර ගාස්තු (නඩත්තුව, තත්ත්වය ඉහළ දැමීම ආදිය ඇතුළුව)
4. සක්‍රීය කිරීමේ ගාස්තු (උදා: PSA/TRC ආදිය)
5. වෙනත් යම් ගාස්තුවක්

ඊ. ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ඇමුණුම් :-

1. භාවිත කළ යුතු උපකරණ, මෘදුකාංග සහ සන්නිවේදන සේවා සඳහා වන විස්තරාත්මක පිරිවිතර පත්‍රිකා ;

2. ස්ථාපනය කිරීමේ, සක්‍රීය කිරීමේ, සහ නඩත්තු කිරීමේ සැලැස්ම සහ ක්‍රමවේදය
(මේ ලේඛනයට වෙනම ඇමුණුමක් ලෙස ඉදිරිපත් කළ යුතු ය.);

3. ගෙවීම් එකතු කිරීමේ සහ පැවරීමේ ක්‍රමවේදය
(මේ ලේඛනයට වෙනම ඇමුණුමක් ලෙස ඉදිරිපත් කළ යුතු ය.);

4. චන්ද්‍රිකා ගාස්තු සඳහා වන වර්තමාන මිල ගණන් සහ මිල ගණන් වෙනස් කිරීමේ ප්‍රතිපත්තිය
(මේ ලේඛනයට වෙනම ඇමුණුමක් ලෙස ඉදිරිපත් කළ යුතු ය.);

5. දත්ත හුවමාරු කිරීමේ ක්‍රමවේදය සහ දත්ත හුවමාරු කිරීමේ ප්‍රතිපත්තිය
(මේ ලේඛනයට වෙනම ඇමුණුමක් ලෙස ඉදිරිපත් කළ යුතු ය.);

6. යෙදවිය යුතු තාක්ෂණික කණ්ඩායම පිළිබඳ විස්තර
(මේ ලේඛනයට වෙනම ඇමුණුමක් ලෙස ඉදිරිපත් කළ යුතු ය.);

7. සේවාව මගින් ආවරණය විය යුතු දිස්ත්‍රික්ක ලැයිස්තුව - මුළු දිවයිනට වඩාත් සුදුසු
(මේ ලේඛනයට වෙනම ඇමුණුමක් ලෙස ඉදිරිපත් කළ යුතු ය.);

8. ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානයට (ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානයට) ලබාදිය යුතු පහසුකම් පිළිබඳ විස්තර (උදා: අධීක්ෂණ තිර, cloud හෝ server පහසුකම) (නොමිලේ ප්‍රවේශවීමේ සහ ඔවුන්ගේ බෝට්ටු අධීක්ෂණය කිරීම ආදිය);

9. ධීවරයන්ට/බෝට්ටු හිමිකරුවන්ට ලබාදිය යුතු පහසුකම් ;

28 වන නියෝගය

### IV වන උපලේඛනය

### ලියාපදිංචි සහතිකය

ශ්‍රී ලංකා ජලතීරයේ සහ මහ මුහුදේ ක්‍රියාත්මක වන ධීවර යාත්‍රා සඳහා වන චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ යාත්‍රා අධීක්ෂණ පද්ධතිය (VMS) සහ වෙනත් ඉලෙක්ට්‍රොනික අධීක්ෂණ ප්‍රොටොකෝල ක්‍රියාත්මක කිරීම.

අ. සේවා සපයන්නා පිළිබඳ විස්තරය :-

1. දේශීය සමාගමේ නම :
2. ලිපිනය :
3. සමාගම් ලියාපදිංචි අංක :
4. VAT ලියාපදිංචි අංකය :
5. ප්‍රධාන සම්බන්ධතාවයේ නම සහ තනතුරු :
6. ප්‍රධාන සම්බන්ධතාවයේ දුරකථන අංකය :
7. ප්‍රධාන සම්බන්ධතාවයේ විද්‍යුත් තැපැල් ලිපිනය :

ආ. බලයලත් සේවාව පිළිබඳ විස්තර :-

1. උපකරණයේ / උපකරණවල නම :
2. වර්ගය සහ මාදිලිය/මාදිලි :
3. මෘදුකාංගය (අනුවාදය) (version) :
4. සන්නිවේදන මාධ්‍යය (අදාළ නම්) :

ඇ. ඉලක්කගත කණ්ඩායම :-

(අ කොටස යටතේ විස්තර දක්වා ඇති) ඉහත සඳහන් සේවා සපයන්නා වෙත ශ්‍රී ලංකාවේ ධීවර ක්ෂේත්‍රය සඳහා (ආ කොටස යටතේ විස්තර දක්වා ඇති) ඉහත සඳහන් සේවාව හෝ භාණ්ඩ ලබාදීම සහ සැපයීම සඳහා මෙයින් බලය පවරනු ලැබේ.

..................................................... දින සිට
..................................................... දින දක්වා වලංගු වේ.

බලය පවරන ලද්දේ :-

අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

EOG 12-0161

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.